# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක. 8,960—1942ක්වූ ජූලි මස 3 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### උපාඩ්ග නීති.

#### ජලහැපසීම පිළිබඳ ආඥාපණ්ණත.

ජලහැපසීම පිළිබඳ ආඥාපණ්ණතේ (312වෙනි පරිච්ඡේදය) 8 (1) වෙනි වගන්තිය අනුව, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඌරුබොක්කඔය ජලකම්ාන්තය යටතේ කොම්කනවට වතුර ලැබියහැකි ප්‍රදේශය තුල ඉඩම් අයිතිකාරයන් අතුරෙන් නීතානුකූල වැඩිදෙනා විසින් වර්ෂ 1942ක්වූ මාර්තු මස 10වෙනි දින පවත්වනලද සභාවේදී සාදනලදුව, එකී ආඥාපණ්ණතේ 14වෙනි වගන්තියෙන් ආණ්ඩුකාර උතුමාණන්වහන්සේට ලැබීතිබෙන බලයපිට අනුදන්නාලද ව්‍යවස්ථාවකි.

ඩී. ඇස්. සේනානායක,
කෘෂිකර්ම සහ ඉඩම් පිළිබඳ ඇමතිතැන.

වර්ෂ 1942ක්වූ ජූනි මස 5වෙනිදා කොළඹදීය.

### ව්‍යවස්ථාව.

වර්ෂ 1932 ක්වූ සැප්තැම්බර් මස 23වෙනි දින නිකුත්කරනලද අංක 7,945කේ ගැසට් පත්‍රයේ පළවූ, ව්‍යවස්ථාවලින් සංශෝධනය කරනලද, වර්ෂ 1910ක්වූ දෙසැම්බර් මස 2වෙනි දින නිකුත් කරනලද අංක 6,413කේ ගැසට් පත්‍රයේ පළවූ ජලහැපසීම පිළිබඳ ආඥාපණ්ණත යටතේ ඌරුබොක්කඔය ජලකම්ාන්තය ගැන සාදනලද ව්‍යවස්ථා එකී 9වෙනි ව්‍යවස්ථාවෙහි "තුන" යන වචනය වෙනුවට "පහ" යන වචනය යෙදීමෙන් තවත් සංශෝධනය කරන්නට යෙදුනා ඇත.

සැලකියයුතුයි.—ඉහත සඳහන් පිළිවෙලට සංශෝධනය කරන ලද 9වෙනි ව්‍යවස්ථාව මෙසේයි:—

> "වෙල්විදානෙ කෙනෙකුගේ රාජකාරි කාලය අවුරුදු පහකට සීමාකරණු ලැබේ. නමුත් ඔහුට නැවතත් තෝරාගනු ලැබීමට පුලුහුකම් තිබේ."

---

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

No. 13,753, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආඥාව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1942ක්වූ අගෝස්තු මස 8වෙනි දිනවූ සෙනසුරාදා පෙරවරු 10ට කෑගල්ලේ ඉඩම් බේරුම්කරණ කන්තෝරුවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටිකෝරළේ පිහිටා තිබෙන බිම්කැබැල්ලක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ අංක. 384. ගම—අතුරලිය.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | මහත, අ.රූ.ප. |
|---|---|---|---|---|
| 14 | අස්වත්තේහේන .. | (1) පෑහදුරේ පදිංචි ජේ. ඒ. ඇල්. විරසිංහ පෙරකදෝරුතැන භාරේ මරිස මිගුරියල් විරසිංහ, (2) හෑසිගිය සිසිල් අර්නස්ට් ගුණරත්නගේ බුදලේ භාරකාරයා වශයෙන් මහභාරකාරතුමා | රබර් | .. 3 2 29 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම ගැන වැඩිදුර තොරතුරු කෑගල්ලේ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, එහි සිතියම කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1942ක්වූ ජූනි මස 25වෙනි දින කෑගල්ලේ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

එච්. ඒ. ජෑන්ස්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

ආණ්ඩුවේ කාවශ්‍යතකට; මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ අංකීය "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ කරතිබෙන ප්‍රකාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම් :—

සිතියමේ අංක. A 1,459. ගම—කොල්ළුපිටිය.

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ.රූ.ප. |
|---|---|---|---|---|
| 1 | ඇල්ලි කොටේජ්, විරි පනම් අංක. 2/1 සහ වරිපනම් අංක. 2 කොටසක්, 23වෙනි පටුමාවත | උළුසෙවිලි කපරාරුකල ගෙයක්ද, සින්ක් තහඩු ගැරේජ් එකක්ද, උළුසෙවිලි කපරාරුකල කක්කුස්සියක්ද, කපරාරුකල තාප්පද, කපරාරුකල කාණුද, කපරාරුකල පඩිද, අඩබිත්තියක කොටසක්ද, ලී ගේට්ටුවල කොටස්ද, කාණු පරීක්ෂාකරණ වලවල්ද, කපරාරුකල ගේට්ටු කණුද, කපරාරුකල ගේට්ටු කණුවක කොටසක්ද ඇති ඉඩම | එච්. ඩබ්ලිව්. පීරිස්, බගතලේ පාර, කොල්ළුපිටිය | 0 0 32·09 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා සයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දන්නුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1942ක්වූ ජූලි මස 30වෙනි දින පෙරවරු 10ට මෙම කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1942ක්වූ ජූනි මස 29වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඒ. ගොඩ්බෙ,
බ. ප. ආණ්ඩුවේ ඒජන්ත වෙනුව.

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ගලගෙදර සිට මැදගමට යන බී. ආර්. සී. පාරේ පලමුවෙනි සැතැප්ම කැපීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203වෙනි පරිච්ඡේදයවූ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගෝර්තුවල ප්‍රකාරයට පලාත් පාලක ආණ්ඩුක්‍රම මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. Extract 1, B. S. V. P. 136. ගම—කාම්බරංගොදෙනිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 28 | හිටිගාමිල්ලෑකුඹුර | .. අවුරුදු 15ක් පමණ ඇති පොල්ගස් 3ක් සහ පුම්ක්ගසක්ද ඇති වගාකොකරන කුඹුර | වෙදකාරගේදවයලෑගෙදර කිරිඹසිඟා | 0 1 31 |
| 29 | හිටිගාමිල්ලෑකුඹුරේපිල්ලෑව | ඔවිට .. .. | එම .. | 0 0 18 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හතරවෙනි වගන්තියේ හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වන 1942ක්වූ ජූලි මස 30වෙනි දින උදය 9.30ගේ කාලයමට ගලගෙදර කානායම්පලේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑම සහ මේම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1942ක්වූ ජූනි මස 22වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ආර්. එස්. ඩැනියල්,
මධ්‍යම පලාතේ ආණ්ඩුවේ අතිරේක ඒජන්ත වෙනුව.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ප්‍රසූත ආරෝග්‍යශාලාවක් ගොඩනැගීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ 203වෙනි පරිච්ඡේදයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගෝර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලයපිට නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 1,347. ගම—මඩ්ඩුවිල්නාඩු.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පෙරුමාල්පුලියඩි | .. අවුරුදු 20ක් පමණ වයස ඇති කොහොඹ ගස් 2ක් තිබෙන මුඩුබිම | ක්‍රිස්තියානි 'මිෂනරි' සමාගම, ඉස්ටෙලියා ගොඩනැගිලි, කොළඹ | 0 0 36·7 |
| 2 | එම | .. අවුරුදු 50ක් පමණ වයස ඇති පොල්ගස් 17ක් තිබෙන පොල්වත්ත, අවුරුදු 50ක් පමණ වයස ඇති තල්ගස් 18ක් තිබෙන තල්මිත්ත, අවුරුදු 10ක් පමණ වයස ඇති තල්ගස් 2ක් (අතරින්පතර පොල් ගස් සහ තල්ගස්) සහ මුඩුබිම | (1) හලාවත දිස්ත්‍රික් උසාවියේ වෙලප්පා රාජරත්නම්ගේ ස්ත්‍රී කමලාම්බිගෙයි, (2) කාසිවිස්හි නාරත්දගෙයිහි පදිංචි කානුසියා අම්බිකාපති, (3) ඈන්. රාජරත්නම් ඩිම්සහල් ට්‍රාන්ස්පෝර්ටර් ඇන් සුප්‍රින්ටැන්ඩන්ට්ගේ කන්තෝරුව, ලංකා ආණ්ඩුවේ දුම්රිය මාර්ගය, මරදාන (නයකාරයා) | 0 3 7·2 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ 203වෙනි පරිච්ඡේදයේ හයවෙනි වගන්තියේ හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වන 1942ක්වූ ජූලි මස 29වෙනි දින පෙරවරු 10ගේ කාලයමට යාපනේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මේම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට සහ ඔප්පුතිරප්පු පෙන්වාසිටින්ටද ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1942ක්වූ ජූනි මස 29වෙනි දින
යාපනේ කච්චේරියේදීය.

ඈම්. ප්‍රසාඩ්,
ආණ්ඩුවේ ඒජන්ත වෙනුව.

---

වම් 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කුකුරුකෝරලේ පාරේ සැතැප්ම 3ගේ කනුවේ ලඟ තිබෙන වංගුව නිසියාකාර පෙනීම ඇතිකරගැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වම් 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගෝර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 92. ගම—මාරපන.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 206 | වැවේගේන | .. ලන්ද | .. සී. වනසුන්දර මහතා .. | .. 0 0 15·25 |
| 207 | එම | .. එම | .. ජේ. ලොකුමැතියෝ සහ එච්. ලමාහාමි | .. 0 0 10·75 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අයට ලියුම්හක්දී වම් 1942ක්වූ ජූලි මස 29වෙනි දින උදේ 10ගේ කාලයමට රත්නපුරේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මේම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1942ක්වූ ජූනි මස 30වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

ආර්. ඈම්. බෙම්ප්,
සබරගමු පලාතේ ආණ්ඩුවේ මහා ඒජන්ත වෙනුව.

---

## සුප්‍රීම් උසාවියේ දැන්වීමයි.

ශ්‍රී ලඞ්කාවිපගේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබීතිබෙන ආඥාවක බලය කාරණකොටගෙන මෙයින් ප්‍රකාශ කරන්නේනම් ඌව දිසාවේ ක්‍රිමිනල් නඩු විභාගය වම් 1942ක්වූ අගෝස්තු මස 3වෙනි දින පෙරවරු 11 පැය පටන් මහනුවර තිබෙන නඩුසාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සැමදෙනාම යටකී ස්ථානයට යටකී වෙලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙන මිස එයින් පිටකටයන්ට නුසුදුසුවත් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

වම් 1942ක්වූ ජූනි මස 30වෙනි දින
බදුල්ලේ පිස්කල් කන්තෝරුවේදීය.

පී. ඈම්. අලූදූ,
ඌවේ පිස්කල් උන්නාන්සේ වෙනුවට.

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.